වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය
සම්පත්පාය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2001.08.10

අමාත්‍යාංශ චක්‍රලේඛ අංක. 05/2001

වන සංරක්ෂක

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු

## රජයට අයත් සියලුම අවශේෂ කැලෑ කළමනාකරණය හා පාලනය කිරීම සඳහා <u>වන සංරක්ෂකට පැවරීම.</u>

රජයේ අවශේෂ කැලෑ කළමනාකරණය යන මැයෙන් යුතු මගේ අංක. 02/02/03/3011 හා 1998/07/01 දිනැති අංක. 05/98 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර, වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02) දැනට ශ්‍රී ලංකාවේ තිබෙන ස්වාභාවික කැලෑ ප්‍රධාන වශයෙන් ආයතන තුනක් මගින් පාලනය කෙරේ. එනම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වේ. රක්ෂිත වනාන්තර, යෝජිත රක්ෂිත වනාන්තර හා ඇතැම් අවශේෂ කැලෑ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලනය කරනු ලබන අතර, දැඩි ස්වාභාවික රක්ෂිත, වන උද්‍යාන, වනමං, අභය භූමි සහ ස්වාභාවික රක්ෂිත, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලනය කෙරේ. වන සංරක්ෂණදෙපාර්තමේන්තුව හෝ වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලනය නොකරනු ලබන කැලෑ රජයේ අවශේෂ කැලෑ වශයෙන් ප්‍රදේශීය ලේකම්වරුන් යටතේ පාලනය වේ.

03) දැනට දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් යටතේ පාලනය වන සියලුම අවශේෂ කැලෑ ජාතික වන ප්‍රතිපත්තියට අදාලව කළමනාකරණය කිරීම, වැඩි දියුණු කිරීම හා ආරක්ෂා කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරනු ලැබේ. (එසේවුවද අවශ්‍ය අවස්ථාවලදී දිස්ත්‍රික් ලේකම්වරුන්ට/දිසාපතිවරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට මෙම කැලෑ වල ආරක්ෂාව සඳහා, වන ආඥාපනත යටතේ පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට මින් බාධාවක් නොවේ.)

04) රජයේ අවශේෂ කැලෑ කිසියම් වෙනත් පරිහරණ කටයුත්තක් සඳහා යොදා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සම්බන්ධ ව්‍යාපෘති යෝජනාව වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් අන්තර් අමාත්‍යාංශ කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වේ. එම අනතර් අමාත්‍යාංශ කමිටුව වන සම්පත්, ඉඩම් හා වන ජීවී යන විෂයය ක්ෂේත්‍රයන්ට අදාල අමාත්‍යාංශවල නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ඉඩම් ලබා ගැනීම සම්බන්ධයෙන් වූ ව්‍යාපෘති යෝජනාව පළමුව දිස්ත්‍රික ඉඩම් පරිහරණ කමිටුවට ඉදිරිපත් කර, ඉන්පසු එම නිර්දේශය වන සංරක්ෂක මගින් ඔහුගේ නිර්දේශ සහිතව අන්තර් අමාත්‍යාංශ කමිටුව වෙත යොමු කළ යුතුය. මෙම කමිටුව මගින් අධ්‍යයනය කරනු ලබන එම යෝජනාව අනුමත කරන්නේ නම් පමණක් ජාතික පාරිසරික පනත යටතේ පරිසර ඇගයීමකට ලක් කිරීම සඳහා එම යෝජනාව යෝජකයා වෙත නැවත යොමු කරනු [illegible]ත. පරිසර ඇගයීමක් අවශ්‍ය වන අවස්ථාවලදී එම පරිසර ඇගයීම සහතිකය යෝජකයා විසින් ලබාගෙන මා වෙත ඉදිරිපත් කළයුතු වේ. අදාල නිර්දේශ අනුව ඉඩම් ලබාදීම පිළිබඳව අනුමැතිය මා විසින් දෙනු ලබන අතර, ඉන් අනතුරුව අවස්ථාවට උචිත පරිදි අදාල පාර්ශවයට සුදුසු කොන්දේසි මත ඉඩම් ලබාදීම සඳහා යෝජිත ඉඩම ඉඩම් කොමසාරිස් වෙත නිදහස් කරනු ලැබේ.

05) දැනට ප්‍රකාශයට පත්කර ඇති ජාතික වන ප්‍රතිපත්තියට අදාලව නව නීති කෙටුම්පත් සකස් කරන තුරු ඉහත සඳහන් ක්‍රියා පිළිවෙත යොදා ගනිමින් රජයේ අවශේෂ කැලෑ කළමනාකරණය කළයුතුය.

06) මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිවය.

07) කරුණාකර මෙම චක්‍රලේඛය ලද බව දන්වනු මැනවි.

එන් . පද්මනාදන්,
ලේකම්,
වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය.

පිටපත් :-

1. ජනාධිපති ලේකම් )- දැන ගැනීම සඳහා.
2. අග්‍රාමාත්‍ය ලේකම් )- දැන ගැනීම සඳහා.
3. අමාත්‍ය මණ්ඩල ලේකම් )- දැන ගැනීම සඳහා.
4. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය. )- දැන ගැනීම සඳහා.